# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1636/16 - 2010 ජනවාරි 15 වැනි සිකුරාදා - 2010.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

**1991 අංක 23 දරන පනත මගින් සංශෝධිත 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත**

1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දෙන ලද විධානය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
සභාපති,
ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය.

වර්ෂ 2010 ක් වූ ජනවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

2010 අංක 1 දරන මුදල් සමාගම් (පොලී) විධානය

1. මෙම විධානය, 2010 අංක 1 දරන මුදල් සමාගම් (පොලී) විධානය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1991 අංක 23 දරන පනත මගින් සංශෝධිත 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කරන ලද සෑම මුදල් සමාගමකට ම අදාළ විය යුතුය. තව ද, මෙම විධානය වහාම බලපවත්වන පරිදි ක්‍රියාත්මක වේ.

2. (අ) මුදල් සමාගමක් විසින් 2010 ජනවාරි 01 දිනෙන් පසුව එළඹෙන කිසියම් කාර්තුවක් තුළ දී බාරගන්නා ලද හෝ අලුත් කරන ලද කාලීන තැන්පතුවක් සඳහා ගෙවිය හැකි උපරිම වාර්ෂික පොලී අනුපාතිකය —

(i) එම තැන්පතුව මාස 12 ක් හෝ ඊට අඩු කල්පිරීමේ කාලයකින් යුක්ත වන්නේ නම්, අදාළ කාර්තුවට ආසන්නතම පූර්ව කාර්තුව තුළ දී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය ඵලදාවට ප්‍රතිශත අංක හතරක් (4) එකතු කිරීමෙන් ලබාගන්නා අගය ද ;

(ii) එම තැන්පතුව මාස 12ට වැඩි කල්පිරීමේ කාලයකින් යුක්ත වන්නේ නම්, අදාළ කාර්තුවට ආසන්නතම පූර්ව කාර්තුව තුළ නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය ඵලදාවට ප්‍රතිශත අංක පහක් (5) එකතු කිරීමෙන් ලබාගන්නා අගය ද

නොඉක්මවිය යුතු ය.

1A - G 12333 — 350 (2010/01)

එසේ වුව ද, මෙම ඡේදයෙහි (i) හෝ (ii) යටතේ, වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයකුගෙන් (මෙහි මින්මතු ජ්‍යෙෂ්ඨ පුරවැසියා ලෙස හැඳින්වෙන ) කාලීන තැන්පතුවක් භාර ගැනීමේ දී හෝ නැවත අලුත් කිරීමේ දී, මුදල් සමාගම විසින් මෙම ඡේදයෙහි (i) හෝ (ii) අනුව නියමිත පොලී අනුපාතිකයට වඩා ප්‍රතිශත අංක එකක් (1) වැඩියෙන් ගෙවිය හැකි ය.

(ආ) මුදල් සමාගමක් විසින් 2010 ජනවාරි 01 දිනෙන් පසුව එළඹෙන කිසියම් කාර්තුවක් තුළ දී, කල්පිරීමේ දී මුදාහැරීම සඳහා ගෙවන වටිනාකමට වඩා අඩු මිලකට තැන්පතු සහතික නිකුත් කිරීමක දී එම තැන්පතු ආයෝජනයක උපරිම වාර්ෂික එලදාව –

(i) එම තැන්පතු සහතිකය, මාස 12 ක් හෝ ඊට අඩු කල්පිරීමේ කාලයකින් යුතු වන්නේ නම්, අදාළ කාර්තුවට ආසන්නතම පූර්ව කාර්තුව තුළ දී නිකුත් කරන ලද දින 364ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය එලදාවට ප්‍රතිශත අංක හතරක් (4) එකතු කිරීමෙන් ලබාගන්නා අගය ද ;

(ii) එම තැන්පතු සහතිකය, මාස 12ට වැඩි කල්පිරීමේ කාලයකින් යුතු වන්නේ නම්, අදාළ කාර්තුවට ආසන්නතම පූර්ව කාර්තුව තුළ දී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සමාන්‍ය එලදාවට ප්‍රතිශත අංක පහක් (5) එකතු කිරීමෙන් ලබාගන්නා අගය ද

නොඉක්මවන පරිදි, තැන්පතු සහතිකය සඳහා පිරිනමනු ලබන උපරිම වට්ටම් අනුපාතිකය තීරණය කළ යුතු වේ.

3. මුදල් සමාගමක් විසින් 2010 ජනවාරි 01 දිනෙන් පසුව එළඹෙන කිසියම් කාර්තුවක් තුළ දී ඕනෑ ම ඉතිරිකිරීමේ තැන්පතුවක් සඳහා ගෙවිය හැකි උපරිම වාර්ෂික පොලී අනුපාතිකය, අදාළ කාර්තුවට ආසන්නතම පූර්ව කාර්තුව තුළ දී නිකුත් කරන ලද දින 91 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සමාන්‍ය එලදා අගය නොඉක්මවිය යුතු ය.

එසේ වුව ද, ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් විසින් ඉතිරිකිරීමේ තැන්පතුවක් පවත්වාගෙන යෑමේ දී, මුදල් සමාගමක් විසින් අදාළ කාර්තුවට ආසන්නතම පූර්ව කාර්තුව තුළ දී නිකුත් කරන ලද දින 91 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය එලදා අගයට වඩා ප්‍රතිශත අංක එකක් (1) වැඩියෙන් ගෙවිය හැකි ය.

4. සෑම මුදල් සමාගමක් විසින්ම, එම මුදල් සමාගම විසින් කිසියම් මාසයක දී ගෙවන ලද පොලී අනුපාතික සහ තැන්පතු සහතික සඳහා අදාළ වට්ටම් අනුපාතික පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක්, එම මාසයට පසු මාසයේ 07 වැනි දිනට ප්‍රථම, අධ්‍යක්ෂවරයා වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

5. මෙම විධානයෙහි —

(i) ''කාලීන තැන්පතු '' යන්නට, 2005 අංක 1 දරන මුදල් සමාගම් (තැන්පතු) විධානයෙහි දී ඇති අදාළ අර්ථයම තිබිය යුතු ය.

(ii) ''අධ්‍යක්ෂවරයා '' යන්නෙන් ශ්‍රී ලංකා මහා බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

6. 2009 අංක 4 දරන මුදල් සමාගම් (පොලී ) විධානය මෙයින් අහෝසි කරනු ලැබේ.

01 - 892 /1

---

**1991 අංක 23 දරන පනත මගින් සංශෝධිත 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත**

1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දෙන ලද විධානය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
සභාපති,
ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය.

වර්ෂ 2009 ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

2009 අංක 5 දරන මුදල් සමාගම් ( වාර්තාකරන අවශ්‍යතා ) විධානය

1. මෙම විධානය, 2009 අංක 5 දරන මුදල් සමාගම් ( වාර්තාකරන අවශ්‍යතා ) විධානය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1991 අංක 23 දරන පනත මගින් සංශෝධිත 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කරන ලද සෑම මුදල් සමාගමකට ම අදාළ විය යුතු ය. තව ද, මෙම විධානය වහා බලපවත්වන පරිදි ක්‍රියාත්මක වේ.

2. සෑම මුදල් සමාගමක්ම, මහ බැංකු මූල්‍ය තොරතුරු පද්ධතියෙහි සපයා ඇති ආකෘතීන්ට අනුකූලව, පහත සඳහන් නියමිත දිනට එක් එක් ආකෘතියට අදාළ තොරතුරු අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

| වාර්තාව | කාලය | නියමිත දිනය |
|---|---|---|
| NBD - WF - 15- LA (ද්‍රවශීල වත්කම්) | සතිපතා | අදාළ සතියට (සඳුදා සිට සිකුරාදා) පසුව එළඹෙන පළමු වැඩ කරන දින |
| NBD - WF - 16- DL (තැන්පතු වගකීම්) | සතිපතා | අදාළ සතියට (සඳුදා සිට සිකුරාදා ) පසුව එළඹෙන පළමු වැඩ කරන දින |
| NBD - WF - 17- AD (ප්‍රදානය කරන ලද ණය ) | සතිපතා | අදාළ සතියට (සඳුදා සිට සිකුරාදා ) පසුව එළඹෙන පළමු වැඩ කරන දින |
| NBD - MF - 01- BS (ශේෂ පත්‍රය) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 7 වැනි දින |
| NBD - MF - 02- PL (ලාභ සහ අලාභ ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 7 වැනි දින |
| NBD - MF - 04- LA (ද්‍රවශීල වත්කම් ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 7 වැනි දින |
| පොලී අනුපාත | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 7 වැනි දින |
| NBD - MF - 03- CA (ණය වර්ගීකරණය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 07- SL (සුරක්ෂිත සහිත විශාල නිරාවරණය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 07- UL (සුරක්ෂිත රහිත විශාල නිරාවරණය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 08- AR (සම්බන්ධිත පාර්ශ්වයන්ට ණය දීම් ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 09- IE (කොටස් ප්‍රාග්ධනයන්හි ආයෝජන ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 10- GA (කල් පිරීම් පරතරය විශ්ලේෂණය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 11- IS (පොලී අනුපාත සංවේදීතාව ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 12- CI (CI) (ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 12- C2 (C2) (ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 12- C3 (C3) (ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |

| වාර්තාව | කාලය | නියමිත දිනය |
|---|---|---|
| NBD - MF - 12- C4 (C4)<br>(ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 13- SC<br>(අංශ අනුව ණය නිරාවරණය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| NBD - MF - 14- IS<br>(පොලි අන්තරය ) | මාසිකව | පසුව එළඹෙන මාසයෙහි 15 වැනි දින |
| විගණනය කරන ලද ශේෂ පත්‍රය | වාර්ෂිකව | පනතෙහි විධානයන්ට අනුව (වර්තමානයෙහි, සෑම මුදල් වර්ෂයක් අවසානයේ සිට මාස 6ක් ඇතුළත) |
| විගණනය කරන ලද ලාභාලාභ ගිණුම | වාර්ෂික | පනතෙහි විධානයන්ට අනුව (වර්තමානයෙහි, සෑම මුදල් වර්ෂයක් අවසානයේ සිට මාස 6ක් ඇතුළත) |
| විගණනය කරන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත | වාර්ෂික | පනතෙහි විධානයන්ට අනුව (වර්තමානයෙහි, සෑම මුදල් වර්ෂයක් අවසානයේ සිට මාස 6ක් ඇතුළත) |

3. 2009 අංක 1 දරන මුදල් සමාගම් ( ද්‍රවශීලතා වත්කම් ) විධානයෙහි 3 වැනි සහ 7 වැනි ඡේදයන්, 2006 අංක 2 දරන මුදල් සමාගම් (අවදානම් මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්ව අනුපාත ) විධානයෙහි 4 (i) සහ 4 (ii) ඡේදයන්, 2006 අංක 3 දරන මුදල් සමාගම් (බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම) විධානයෙහි 5 (i), 5 (ii) සහ 5 (iii) ඡේදයන් සහ 2009 අංක 4 දරන මුදල් සමාගම් (පොලී ) විධානයෙහි 4 වැනි ඡේදය මෙයින් අහෝසි කරනු ලැබේ. පනත යටතේ පනවා ඇති අනෙකුත් වාර්තාකරන අවශ්‍යතා සහ ඒ යටතේ නිකුත් කර ඇති විධානයන්හි වෙනසක් සිදු නොවේ.

4. යම් වාර්තාවක් නියමිත දිනයට ඉදිරිපත් කිරීමට නොහැකි වූ අවස්ථාවක, අදාළ මුදල් සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරියා විසින් පැහැදිලි කිරීමක්, නියමිත දිනයෙහි සිට දින 7ක් ඇතුලත අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කළ යුතුය.

5. යම් වාර්තාකරන කාලච්ඡේදයකට අදාළව වාර්තා 2 ක් හෝ වැඩි ප්‍රමාණයක් නියමිත දිනයට ඉදිරිපත් කිරීමට නොහැකි වූ අවස්ථාවක හෝ යම් වාර්තාවක් අඛණ්ඩව වාර්තා කරන කාලච්ඡේද දෙකක දී නියමිත දිනයට ඉදිරිපත් කිරීමට නොහැකි වූ අවස්ථාවක, මුදල් මණ්ඩලයට වාර්තා කිරීම සඳහා අදාළ මූල්‍ය ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැහැදිලි කිරීමක් අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කළ යුතුය.

6. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජන මාධ්‍ය තුළින් ලියාපදිංචි මුදල් සමාගම් ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීමේ දී, 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ නිකුත් කොට ඇති විධානයන්ට සහ නියමයන්ට එක් එක් මූල්‍ය සමාගම විසින් අනුකූල වී ඇති ආකාරය අනුව මුදල් සමාගම් වර්ගීකරණය කරනු ලැබේ.

7. පනත යටතේ නිකුත් කොට ඇති විධානයන්ට සහ නියෝගයන්ට අනුකූල නොවන මුදල් සමාගම් සඳහා නව ශාඛා/කාර්යාල විවෘත කිරීමට සහ නව ව්‍යාපාරික නිෂ්පාදන/සේවා සඳහා අනුමැතිය දෙනු නොලැබේ.

8. මෙම විධානයෙහි —

(අ) ‘‘පනත’’ යන්නට, 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත අදහස් වේ.

(ආ) ‘‘අධ්‍යක්ෂවරයා’’ යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

(ඇ) ‘‘මහ බැංකු මූල්‍ය තොරතුරු පද්ධතිය ’’ යන්නට, මූල්‍ය තොරතුරු යොමු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන සඳහා සපයා දී ඇති, අන්තර් ජාලය මත පදනම් වූ දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය අදහස් වේ.

(ඈ) ‘‘සතිය’’ යන්නට, සඳුදා දිනයෙන් ආරම්භ වන සතිය අදහස් වේ.

01-892/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.